# සූරියකන්ද ඝාතක භේදවාචකය



සූරියකන්ද සිසු ඝාතනය අපේ රටේ සිදුවූ අති බිහිසුණු කෲර බේදවාචකයකි.
මේ එම ඝාතනය පිළිබඳ රහස් පොලිසිය කළ අපක්ෂපාතී පරීක්ෂණයේදී ඊට මුල් වූ කරුණු ඇසුරින් සකස්වූ ලිපියකි.

11 කොටස



## මිනීමැරුම් නඩු පවරන්න
# අපට නීතියෙන් ඉඩක් නැහැ
## එය ආණ්ඩුව කළ යුතුයි




**මවුපියන් විසින් සිසුන් 20 දෙනකුගේ අතුරුදන්වීම පිළිබඳ අප අදාළ පුද්ගලයන්ට විරුද්ධව නඩු පවරා තිබෙනවා. මේ 20න් නඩු 6ක් පමණ සාක්ෂි විභාග ආරම්භ කළායි සාක්ෂි විභාග යේදී පෙත්සම්කරුවන් සාක්ෂි දී තිබෙනවා. සමහර පෙත්සම්කරුවන්ගෙන් හරස් ප්‍රශ්න පවා අහලා තිබෙනවා. සාක්ෂි තවම සම්පූර්ණයෙන් ඉවර කරලා නැහැ.**

ඒත් දැන් සූරියකන්දෙන් ඇටසැකිලි සොයාගෙන තියෙනවා. ඇත්තෙන්ම මේ ඇට කැබලි ඒ ළමයින්ගේ කියල කියනවා නම් තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස් වෙනවා. මොකද අපි ඒ ළමයි අතුරුදන්වීමට විරුද්ධව හබයාස්කෝපුස් නඩුවක් පවරලා තියෙන්නේ. වඩාත් පැහැදිලිව කියනවා නම් අත්අඩංගුවට අරගෙන ඉන්නවා නිදහස් කරන්න යැයි ඉල්ලා සිටීමක්. මේකෙන් තේරෙන්නේ ඇට කැබලි ඒ ළමයින්ගේ කියා හඳුනාගත්තොත් එයින් කියැවෙන්නේ ඔවුන් ජීවතුන් අතර නැහැ කියන එකයි. එහෙම නම් අතුරුදන් වීම පිළිබඳ නඩුව පවත්වාගෙන යන්න බැහැ. එසේ නම් ඒකට විරුද්ධව මිනීමැරුම් හා පැහැරගෙන යෑමේ නඩුවක් පවරන්න ඕනෑ.

දැන් එන නඩුවට අනුවත් අද වෙනකොට පැහැරගෙන යෑම් සම්බන්ධව සාක්ෂි ඉදිරිපත් වෙලා තියෙනවා. රහස් පොලිස් වාර්තාවේ පවා මේ බව දක්වා තිබෙනවා. එහෙම වුණාම සාමාන්‍යයෙන් කෙරෙන්නේ නීතිපතිවරයා විසින් පැහැරගෙන යෑම් කළා කියලා චෝදනාවට ලක් වූවන්ට විරුද්ධව නඩු පැවරීමත් ඒ පුද්ගලයන්ට නිදහසේ ඉන්නට ඉඩ හැර තිබෙනවා.

නීතිපති හඳුනා ගැනීම් කළ පසු නීතිමය ක්‍රියාමාර්ගයක් නොග න්නවා නම් ඒක බැරෑරුම්ව සලකා බැලිය යුතු කාරණාවක් වෙනවා. අපේ රටේ නීතිය අනුව මිනීමැරුම් නඩුවක් මෙහෙයවීමේ අයිතිය නීතිපතිට හෝ රජයට හෝ අයිති කාර්යයක් වෙනවා. ඔවුන් ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග නොගන්නවා කියන්නේ එය යට ගැසීමට මාන බලනවා කියන එකයි.

ප්‍රජාතන්ත්‍ර අයිතීන් සුරැකීමේ සංවිධානය

### පරීක්ෂණවලට සහාය වන්න පොලිස්පතිගෙන් ජනතාවට ඇරයුමක්

පියවර 1

අපගේ දරුවන් පැහැරගෙන ගිය 6 වැනි කාලතුවක්කු හමුදාවේ සෙබළුන් හා සෙවණ හමුදා කඳවුර භාරව කටයුතු කළ ලුතිනන් ගිනිගේ හා ලුතිනන් කබ්රාල් යන අය අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීම.

පියවර 2

එවක ඇඹිලිපිටියේ 6 වැනි කාලතුවක්කු හමුදාවේ මෙහෙයුම් සම්බන්ධීකරණය වේශධාරී වශයෙන්ද කටයුතු කළ කර්නල් ආර්.පී. ලියනගේ සහ ඔහුගේ දෙවැනියා වශයෙන් කටයුතු කළ කපිතාන් ජාලිය ඇපා යන අය අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීම.

පියවර 3

එවක ඇඹිලිපිටිය මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති වශයෙන් කටයුතු කළ දයානන්ද ලොකුගලප්පත්ති සහ ඔහුගේ දෙවැනි පුත් (දැනට හමුදාවේ සේවයේ නියුතු) චමින්ද ගලප්පත්ති යන අය අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීම.

පියවර 4

සූරියකන්ද මුදුනෙහි පිහිටුවා තිබූ 6 වැනි කාලතුවක්කු හමුදාවේ අනුබණ්ඩය භාරව සිටි නිලධාරි තැන ඇතුළු සෙබළුන්ගෙන් ප්‍රශ්න කිරීම.

පියවර 5

දැනට නීතිපති වෙත භාරදී ඇති අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ වාර්තාවක් හෙළිකොට ඇති කරුණු අනුව මෙම අපරාධය හා සම්බන්ධ වූවන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම.

-ඇඹිලිපිටිය මවුපියන්

### සිහලුනි මරා දැමූ ඒ දෙමළාගේ ප්‍රකාශය නැවත කියවා බලව්

අපි ජාතිවාදීන් නොවෙමු. සිංහල ජනයාගේ අයිතිය උදුරා නොගනිමු. අපි අපේ සටනේ දී සිංහල ජනතාව ආදරයෙන් සිහි කරමු. ඔවුන්ගේ සාධාරණ සටන්වලදී අපගේ සහයෝගය පළ කරමු. එලෙස ම අපේ විමුක්ති සටනට සිංහල ජනයා සහාය දිය යුතුය. අනෙකාගේ නිදහස ගැන උනන්දු නොවන පුද්ගලයා තමාගේ නිදහස ද වළලා ගනී. අපට අත් වූ ඉරණම ශ්‍රී ලංකා ජනතාවට ද මතු දිනෙක අත්වනු ඇත. ගුරුනගර් වධ කඳවුර හම්බන්තොටට ගෙන යනු ඇත. අද ද්‍රවිඩ තරුණයන් ඒවායෙහි වධ විඳිනු ඇත.

කුට්ටුමනි (උසාවියේ දී 1982) Telo සංවිධානය

### ලංකාවේ මිනීමැරුම් ගැන ඇමෙරිකාවේ මතය

කොච්චර මැරුවත් අපි ආධාර දෙනවා

ඕනෑම සමාජයක හිංසනයේ පැතිරීම ස්වරූපයේ නිශ්චිත මට්ටමක් තියෙනවා. ඒත් දේශපාලනයේදී මිනීමැරුමක් කියන්නේ සාමාන්‍යයෙන් අපි කවුරුත් දන්න මිනීමැරීම කියන වචනාර්ථයට වඩා සන්දර්භයක් ඇති දෙයක් නිසා දේශපාලන මිනීමැරුම් තුළ අර්ථකථනයට ඇති ඉඩකඩ බහුලයි. ඉතින් මේ තත්ත්වය කවුරු කොහොම කොච්චර ප්‍රයෝජනයට ගනීද කියලා කාටවත් පළමුව කියන්න බැහැ. ලංකාවේ ඇත්තටම සිද්ධ වුණේ ඒකයි, මිනී මරන එක දේශපාලන ක්‍රියාවක් කියන එක ලංකාවේ මිනිස්සු එතකන් දැනන් හිටියේ නැහැ.

හැබැයි අපි ඉතාමත් ක්‍රමවත් විදිහට නීතියෙන් පිටත මිනීමරන ආකාරය හා ඒවා මෙහෙයවන හමුදා හා දේශපාලන නායකයන් පිළිබඳව තොරතුරු රැස් කරගෙනයි හිටියේ. ඒවායින් සමහරක් කරුණු අඩංගු ප්‍රකාශන පවා ඉතා සීමිත ඉඩකඩක් තුළ ප්‍රකාශයට පත් කළා. අනිත් පැත්තෙන් අපි ඉතාමත් නිශ්චිත දේශපාලන තීරණයක් අරගෙන තිබුණා. ඒ තමයි ආධාර මුදල් දීම දිගට කරගෙන යා යුතුයි කියන එක. ඒ දවස්වල ආධාර දෙන කණ්ඩායම් යුරෝපීය හා ස්කැන්ඩිනේවියානු සාමාජිකයන් තවදුරටත් කොළඹ ආණ්ඩුවට ආධාර කිරීම නැවැත්විය යුතු බව ප්‍රකාශ කළා. අපි තරමක් එතැනදී අමාරුවක වැටුණා. මොකද ඒ වෙනකොට කොළඹ හිටපු බ්‍රිතාන්‍ය තානාපති කොළඹ ආණ්ඩුව සමඟ හොඳටම කිපිලයි හිටියේ. ඒත් අපිට පුළුවන් වුණා ඉතා වැදගත් කාරණාවක් ඒ අයට මතක් කරන්න. ඒ තමයි ක්‍රමය දිගටම පවත්වාගෙන යෑමට නම් ආධාර මුදල් දිගටම දිය යුතු බව. ක්‍රමයට වඩා මිනිස් ඝාතනවලට මුල්තැන දුන්නත් එය ක්‍රමයේ අවසානය බව අපි ඔවුන්ට තේරුම් කරලා දුන්නා. තත්ත්වය පාලනය කිරීම කොළඹ ආණ්ඩුවේ වගකීමක් බවත්, ක්‍රමය පවත්වාගෙන යෑමේ වගකීම අපේ බවත්, අන්තිමට අපි හැමෝම තේරුම් ගත්තා.

ලෝකයේ සිදුවන හැම දෙයක්ම "අපට වුවමනා අයුරින්ම සිදුවන බව පෙන්වීම" කියන මැජික් පොල්ල වැනීමට වොෂින්ටනයේදී ඔබට හැම විටම කරන්න බැහැ. ලංකාවේ සිදුවූ සෑම දෙයක්ම හා සම්බන්ධව කොළඹ ආණ්ඩුවේ තොරතුරු පිළිබඳ ලේඛනගත කිරීමක් කියවන විට පිළියෙල කරලායි තිබුණේ. ඒ මොකද කොයි මොහොතක හෝ ඇමෙරිකන් පුවත්පත් මේ ප්‍රශ්න එළියට අදියි කියල. ඒත් එහෙම දෙයක් සිද්ධ වුණේ නැහැ. පෞද්ගලික මට්ටමෙන් බටහිර රාජ්‍ය තාන්ත්‍රිකයන් බොහෝ දෙනෙක් ලංකාවේ සිදුවන දේ හොඳින් දැනගෙන හිටියේ. දැන් ඔබට ඉතා පැහැදිලි ඇති ලංකාවේ මිනිස් අයිතිවාසිකම් කියන ගැටලුව දිහා ඇමෙරිකා යුරෝපීය දෘෂ්ටි කෝණය කුමක්ද කියන එක.

**(භීෂණ සමයේ ශ්‍රී ලංකාවේ සිටි ඇමෙරිකන් පුවත්පත් කලාවේදියකු වන ස්ටීවන් කෝල්ගේ සටහනකින් උපුටා ගන්නා ලදී)**

**ලබන සතියට**

raviprasadherat@gmail.com

සැකසුම - රවිප්‍රසාද් හේරත්